තානාපතිනි ඇලයිනා බී. ටෙප්ලිට්ස් විසින් ඊක්වල් ග්‍රවුන්ඩ් (Equal Grounds) 15වන සංවත්සර රාත්‍රී භෝජන සංග්‍රහයේ හා සම්මාන ප්‍රදානෝත්සවයේ දී ඉදිරිපත් කළ අදහස්

ආයුබෝවන්. වනක්කම්, අසලාම් අලායිකුම්, සුබ සැන්දෑවක්. ඊක්වල් ග්‍රවුන්ඩ් ව්‍යාපාරයේ (Equal Ground 2019 PRIDE) මෙම සැමරුම සඳහා සහභාගී වීමට ලැබීම සතුටට කරුණක් මෙන් ම සමරිසි, ද්විරිසි, සංක්‍රාන්ති හා අන්තර් ලිංගික (LGBTIQ) ප්‍රජාවේ සමානත්වය හා අන්තර්ග්‍රහණය වෙනුවෙන් බොහෝ දෙනෙක් පැමිණ සිටීම දකින්නට ලැබීම ද සතුටට කරුණකි. අද රාත්‍රියේ "සමානාත්මතා රණශූර සම්මාන" (Equality Warrior Awards) ලබන සියලු දෙනාට ම මගේ සුබ පැතුම් පිරිනමන්නට කැමතියි. ඔබේ කැපවීම හා නිරතතාව ගැන ස්තුතිවන්ත වෙමි. ශ්‍රී ලංකාව තුළ මානව අයිතිවාසිකම් සහ අන්තර් සම්බන්ධතා ප්‍රවර්ධනය කිරීම සඳහා මෙම (Equal Grounds) සංවිධානය සමග 2010 වර්ෂයේ සිට එක්සත් ජනපද තානාපති කාර්යාලය එක් ව කටයුතු කර තිබේ.

ඔබ මෙන් අප ද සෑම කෙනෙකුට ම සමාන අයිතිවාසිකම් තිබිය යුතු යයි විශ්වාස කරමු. ඔබ මෙන් අපත් විනිවිදභාවය ගැන විශ්වාස කරමු. ඔබ මෙන් ම අපත්, විවිධත්වය විසින් අප වඩා හොඳ සමාජයක් බවට පත් කරන බව පිළිගනිමු.

මෙම හවුල් වටිනාකම් සිහි තබා ගනිමින්, සමරිසි, ද්විරිසි, සංක්‍රාන්ති, අන්තර් ලිංගික හා ස්ත්‍රී පුරුෂ භාවය ප්‍රශ්නාර්ථකාරී අයගේ (LGBTIQ) අයිතිවාසිකම් පිළිබඳ දැනුවත් කිරීම්; සමලිංගිකත්වය තහනම් කරන නීති පිළිබඳ පර්යේෂණ සිදු කර ඒවා ප්‍රතිසංස්කරණය කිරීම; රැකියා ස්ථානවල සහ ප්‍රජාවන් අතර විවිධත්වය ප්‍රවර්ධනය කිරීම; ප්‍රජාතන්ත්‍රවාදී පරිසරයක් තුළ පිළිගත නො හැකි ආකාරයට හා වෙනස් ලෙස සැලකීමට භාජනය වන සමරිසි, ද්විරිසි, සංක්‍රාන්ති හා අන්තර් ලිංගික (LGBTIQ) ප්‍රජාවන් කොන් කිරීම සම්බන්ධයෙන් රට තුළ ඇති ආකල්ප වෙනස් කිරීම ආදිය පිළිබඳ ව කටයුතු කරන සංවිධානවලට ආධාර ලෙස තානාපති කාර්යාලය විසින් අරමුදල් ලබා දී තිබේ.

අද අපි මෙම (LGBTIQ) අයිතිවාසිකම් සමරමින් ඉතා වැදගත් සන්ධිස්ථානයකට පැමිණ සිටිමු. අප පැමිණ සිටින්නේ ඊක්වල් ග්‍රවුන්ඩ් සංවිධානය මගින් කාර්යක්ෂමව හා කැපවීමෙන් යුතුව වසර 15 ක කාලයක් මෙම අයිතීන් වෙනුවෙන් පෙනී සිටීම සැමරීමටයි. ඉදිරි මාර්ගය ඉතා දීර්ඝ හා අභියෝගාත්මක විය හැකි නමුත් මෙතෙක් ලබා ගෙන ඇති ජයග්‍රහණ පිළිගැනීම හා ඒ ගැන සතුටු වීම මේ මොහොතේ කළ යුතු ය.

'සමානාත්මතා රණශූරයෝ' සම්මාන (Equality Warrior Awards) පිරිනැමීම එය කළ හැකි එක් ක්‍රමයකි. මෙහි දී සිදු වන්නේ සමහර විශේෂ පුද්ගලයින්ගේ ජයග්‍රහණ හඳුනා ගෙන ඒ ගැන ප්‍රීති වීමයි. සම්මානලාභීන් අපට ආදර්ශයක් සපයන්නේ ස්වයං නිර්ණය, දයානුකම්පාව, නායකත්වය සහ සමහර විට මේ සියල්ලට ම වැඩියෙන් වෙනසක් කළ හැකිය යන විශ්වාසයයි.

සමරිසි, ද්විරිසි, සංක්‍රාන්ති හා අන්තර් ලිංගික (LGBTIQ) ප්‍රජාව තුළ සිටින අයගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීමේ දී එක්සත් ජනපදයේ ඇති වඩාත් ම බලවත් වර්ධනයන්, සාමාන්‍ය - නමුත් අසාමාන්‍ය- මිනිසුන්ගේ ක්‍රියාකාරකම් තුළින් ලබා ගත් ජයග්‍රහණ වේ. ඒවාට ලිංගික දිශානතිය හෝ ලිංගිකත්වය මත පදනම් ව සිදු කරන වෛරී අපරාධ වලට ප්‍රතිචාර දැක්වීමේ සිට මහජන ආකල්ප හා අවබෝධය වෙනස් කිරීම දක්වා වූ පුළුල් පරාසයක කටයුතු අයත් වේ. සමානත්වය ළඟා කර ගැනීම සඳහා ඒ වෙනුවෙන් පෙනී සිටින, අද රාත්‍රියේ සම්මානයට පාත්‍ර වන ආකාරයේ රණ ශූරයන් සිටිය යුතුයි.

ශ්‍රී ලංකාවේ සහ එක්සත් ජනපදයේ අප අයත් වන බොහෝ ප්‍රජාවන් විවිධාකාර වේ. අපගේ මිතුරන්, අසල්වැසියන් සහ එකට වැඩ කරන අය විවිධ වයස් කාණ්ඩ, වාර්ගිකත්ව, සංස්කෘතීන්, ජාති, ආගම් සහ දිශානතිවලට අයත් වෙති. ආර්ථික, භූගෝලීය හා සමාජ පසුබිම් ගැන සඳහන් කළ යුතු නොවේ. මෙම වෙනස්කම්, අපි ශක්තියක් ලෙස මිස බෙදීම් සඳහා අවස්ථාවක් ලෙස නො සැලකිය යුතයි. අපේ ප්‍රජාවන්ට විවිධ පැතිකඩ තිබුණත්, අපි කථා කළ යුත්තේ එක් ප්‍රජාවක් ගැන ගැනයි

ඇමරිකාවේ වඩාත් ම ප්‍රසිද්ධ කිවියෙක් වන වෝල්ට් විට්මන්, එක්සත් ජනපදය "ශ්‍රේෂ්ඨ කවියක්" ලෙස විස්තර කර ඇත. ඔහු මෙසේ කීවේ, කවි සහ ප්‍රජාතන්ත්‍රවාදය යන දෙක ම තම ශක්තිය ලබා ගන්නේ එකම ස්ථානයකින් නිසාය. එනම් අසම කොටස්වලින් ඒකාබද්ධ පූර්ණයක් නිර්මාණය කිරීමේ හැකියාවයි. අපගේ බොහෝ ජනකොටස් දරුණු ලෙස බෙදී සිටින හා අසම කොටස්වලින් ඒකාබද්ධ පූර්ණයක් නිර්මාණය කිරීම සඳහා වෙහෙසෙන මේ අවස්ථාවේ මම හිතන්නේ විට්මන් මහතාගේ ප්‍රඥාව විශේෂයෙන්ම වැදගත් වන බවයි. වෙනත් ප්‍රජාවන්ට අයත් දේශපාලනික වශයෙන් උසි ගැන්වූ කොටස් විසින් මුස්ලිම් ප්‍රජාව හිරිහැරයට පත් කිරීම ඉලක්ක කර ගත් ශ්‍රී ලංකාවේ වාර්ගික ආතතිය පෙන්නුම් කළ මෑත සිදුවීම් දෙස බලන්න. ප්‍රචණ්ඩත්වය සහ ද්වේෂය ගෙන එන්නේ විනාශය හා අවමානයයි. සාමය සහතික කිරීම සඳහා ආදරය සහ පිළිගැනීම අවශ්‍ය වේ. අසම කොටස් වලින් ඒකාබද්ධ සමස්තයක් නිර්මාණය කළ හැක්කේ ද ආදරය හා පිළිගැනිම තුළිනි.

ඇමරිකන් ජාතිකයෙකු ලෙස, මගේ රටෙහි විවිධත්වය මම අගය කරමි. ඔබේ ජයග්‍රහණ සැමරීමට ඔබ සමග එක්වීමට ලැබීම ගැන සතුටු වන අතර ඔබේ (Equal Grounds) සංවිධානය මගින් සිදු කරන වැදගත් කාර්යයන් සඳහා එක්සත් ජනපද තානාපති කාර්යාලයේ සහයෝගය දිගටම ලබා දීමට කටයුතු කරමි. මේ කටයුතු ගැන මම ආඩම්බර වන ආකාරයට ම, සියල්ලන්ට ම ගරු කිරීම හා සමානාත්මතාව සහතික කිරීම සඳහා ඔබ ඉටු කරන කටයුතු ගැන ද ආඩම්බර වන ලෙස මම ඔබෙන් ඉල්ලා සිටිමි.

ඔබ සැමට ස්තුතියි.